# මෙත් සවිය

## මනස අධ්‍යාපන සංවර්ධන මෛත්‍රී සංසදය

## METH SAVIYA NEWSLETTER

• සාමාජිකයින් සඳහා තොරතුරු පත්‍රිකාව • 2004 දෙසැම්බර් • මෙත්සවිය දෙවන කාණ්ඩය • හතරවන කලාපය



නිතින් මෙත් සිතින් මම් වෙසෙම් වා !
ගතින් මෙත් සිතින් රෝ මුදම් වා !
බැතින් තුන් රුවන් ඔප නගම් වා !
මෙතින් නෙත් පියම් වා නිවෙම් වා !

# මෙත් සවිය සදහම් චාරිකාව - 05.09.2004





























05.09.2004 ඉරුදින
අළුත්ගම තලවත්ත
ධර්මදීප යෝග්‍රාශ්‍රමයේ
මුහුද මැද පිහිටි පංචකප
දූපතේදී පැවැත්වූ පස්වන
දාන-සීල-භාවනා
වැඩසටහනේ අවස්ථා
කිහිපයක්.



**අප ගැන වචනයක් ....** මෙත් සවිය සංසදය නිරවුල් මනසක් ඇති වර්ධනය කරගත් මානසික ශක්තියක් සහිත බුද්ධිමත් ශ්‍රී ලාංකික ජනතාවක් බිහි කිරීමේ අරමුණින් අරඹන ලද සාමාජිකයින්ගේ එකතුවකි. ඒ ඒ ක්ෂේත්‍රයන්ට අදාල විශේෂඥයින් හා උගතුන් ගෙන්වා සාමාජිකයින් දැනුවත් කරනු වස් විවිධ වැඩසටහන් මෙමගින් පැවැත්වීමට බලාපොරොත්තු වනු ලැබේ. වැඩසටහන් සඳහා මාතෘකා තොරා ගැනීමද සාමාජිකයින්ගේ කැමැත්ත / ඉල්ලීම මත සිදුකරනු ලැබේ. සංසදය විසින් පවත්වනු ලබන සාර්ථකව ඉගෙන ගන්නා අන්දම හා විභාග සමත්වන අන්දම, කාල කළමනාකරණය, නායකත්වය, ත්‍රෛමාසික චිත්ත සංයම අභ්‍යාස හා භාවනා වැඩ සටහන් වැනි ඒ ඒ කාලවලදී පවත්වන වැඩ සටහන් සඳහා සහභාගිවීමේ වරප්‍රසාදය සියලු සාමාජිකයින්ට හිමිවේ. මීට අමතරව සාමාජිකයින්ගේ දැනුම හා ශික්ෂණය වර්ධනය කිරීම සඳහා සෑම මාස තුනකටම වරක් දාන - ශීල - භාවනා වැඩ සටහන්ද පවත්වනු ලැබේ. සංසදයේ ප්‍රධාන නිලතල දරන විධායක කමිටු හා ක්‍රියාකාරි කමිටු සාමාජිකයින් මාංශ භක්ෂණයෙන් හා රහමෙර පානයෙන් තොර දිවි පැවැත්මක් ඇති අය වීම මෛත්‍රී පෙරදැරිව කටයුතු කරන මෙම සංසදයේ විශේෂත්වයකි. වර්තමාන සාමාජික සංඛ්‍යාව දහසක් පමණ වන අතර මී ළඟ චිත්ත සංයම අභයාස හා භාවනා වැඩසටහන පැවත්වීම හා නව සාමාජිකයින් බඳවාගැනීම සඳහා සාමාජික අයදුම් පත් නිකුත් කිරීම 2005 මාර්තු මාසයේදී සිදුකෙරේ.

# සාමාජිකයින් සඳහා වැදගත් තොරතුරු

## මීළඟ දාන-සීල-භාවනා වැඩසටහන 05.12.2004

අප සංගමයේ මීළඟ මාසික දාන - ශීල භාවනා වැඩසටහන හා රැස්වීම් 2004 දෙසැම්බර් මස 05 වන ඉරුදින රාජගිරිය කළුපළුවාවේ තපෝවනයේ දී පැවැත්වේ. එදින වැඩසටහනට සහභාගී වන සියළු සාමාජිකයින් සිල් සමාදන් වීමට සුදුසු ඇඳුමින් පැමිණෙන්නේ නම් මැනවි. එදින පැමිණෙන විට හීල් දානය හා දහවල් දානය සඳහා ඔබට හා තවත් කෙනෙකුට සෑහෙන සේ පළතුරු රැගෙන එන්න. මෙත්සවිය භාවනා පවුල්වල සාමාජිකයින් එක් වී (දුරකථන මගින් සාකච්ඡා කර) අවශ්‍ය දානය රැගෙන ඒමද සිදුකල හැකිය.

භාවනා මධ්‍යස්ථානයේ වැඩවසන භාවනානුයෝගී ස්වාමින්ද්‍රයන් වහන්සේලා 30 නමකට පමණ හා ගිහියෝගීන් කිහිප දෙනෙකුට අළුයම 5.00 ට දෙන කැඳ පූජාවට සහ පෙ.ව. 7.00 හීල් දානය හා දහවල් 10.30 ට දානය හා සවස ගිලන්පස මෙත් සවිය විසින් බාරගෙන තිබේ. දායක වීමට කැමති පිංවතුන් එදිනම ඉතා සුළු මුදලක් දහවල් දානයට පෙර ලේකම්තුමා වෙත බාරදෙන්න. (මෙම අත්‍යවශ්‍ය නොවේ. ඔබ කැමැත්තෙන් දෙන්නේ නම් පමණි). මෙය භාවනා මධ්‍යස්ථානය පිරිකර පුජාකිරීමට කැමති භවතුන් භාවනා මධ්‍යස්ථානයට දැනට හිඟව පවතින පහත සඳහන් ද්‍රව්‍යවලින් (ගරු නායක ස්වාමින්ද්‍රයන්ගෙන් හා ලියන මහතාගෙන් අපකළ විමසීමෙන් දැනගත් පරිදි) යමක් පුජාකරන්නේ නම් එය විචාර බුද්ධියෙන් කරනු ලබන මහත් පුණ්‍යකර්මයක් වනු ඇත.

භාවනා කරන ස්වාමින් වහන්සේලා වෙනුවෙන් මදුරු කොයිල්, (දුගර), රෙදි පාපිසි, දාන ශාලාවට අවශ්‍ය පිගන්, කෝප්ප, හැඳි, ඉගෙන ගන්නා ස්වාමින්වහන්සේලාට අවශ්‍ය A4 කඩදාසි කොළ, පොත් පත්, බෝල්පොයින්ට් පෑන්, ආදිය හා දානය ගෙනයාම සඳහා භාවිතා කළ හැකි ප්ලාස්ටික් බාල්දි, වැසිකිලි සඳහා බාල්දි, පෙඩස්ටල් විදුලි පංකා, මුද්දර කවර, ටෝච්, ඉටිපන්දම්, පෙන්ටෝච් බැටරි, දැනට අවශ්‍ය ද්‍රව්‍යයි. (මේ පිළිබඳ වැඩි විස්තර අවශ්‍යනම් මෙත්සවිය දාන - ශීල - භාවනා වැඩසටහනේ සංවිධායක සරත් ඉලංගන්තිලක මහතා වෙත දුක. 0714893218 මගින් අමතා දැන ගත හැක).

සහභාගී වන පිරිස වෙනුවෙන් ගිලන්පස පූජාව (උදේ සවස) සංවිධායක කමිටුවේ අනුග්‍රහක භවතුන් 5 දෙනෙකු විසින් දීමට භාරගෙන තිබේ. එදින පෙ. ව. 8.00 වන විට කලපලුවාව ගෝතම තපෝ වනයේදී අටසිල් දීමට බලාපොරොත්තු වන බැවින් පුද්ගලිකව පැමිණෙන පිංවතුන් පෙ.ව. 8.00 වන විට තපෝවනයට පැමිණ සිටිය යුතුයි. (බොරැල්ල බස්නැවතුම් පලෙන් මාර්ග 150 බස්රථයෙන් පැමිණෙන විට තපෝවනය අසලින් බැසීම සිදු කළහැකිය. ලිපිනය: ගෝතම තපෝ වනය, කලපලුවාව, මුල්ලේරියාව-නව නගරය.) මීට අමතරව, මෙත්සවිය මගින් කොළඹ 7 බෞද්ධාලෝක මාවතේ පිහිටි ධර්මගවේෂී බෞද්ධ ආශ්‍රමය අසල සිට තපෝවනය දක්වා පෙ.ව. 6 සිට පෙ.ව. 7.45 දක්වා ෂටල් බස් සේවාවක් යොදවා ඇත. (වැඩි විස්තර සමලේකම් චමින්ද මහතා අමතා (0773065807) දැන ගත හැක. කලින් මුදල් ගෙවීම අවශ්‍ය නැත. එදිනට රු: 20/- ක් වැනි සුළු මුදලක් ගෙවා යා හැකිය.) ප. ව. 4.00 ට වැඩ සටහන අවසන් වුවාට පසු අවශ්‍ය අයට බොරැල්ලට පැමිණීමටද බස් රථ සේවාව යොදවා ඇත.

## සාමාජිකයින් සඳහා සහ සාමාජිකයන්ගේ පවුල්වල අය සඳහා නොමිළයේ ඇස් පරීක්ෂාව හා ඇස්කණ්නාඩි ලබාදීම

ඉහත වැඩසටහන සඳහා ඇස් පරීක්ෂා කිරීම ශ්‍රී ලංකා අක්ෂිදාන සංගමයේ දෘෂ්ටි විශේෂඥයින් විසින් තපෝවනයේදී පෙ.ව. 9.00 සිට ප.ව. 4.00 දක්වා භාවනා වැඩසටහනට බාධා නොවන පරිදි පැවැත්වීමට සැලසුම් කර ඇත. මීට අමතරව ජනවාරි මාසයේ 09.01.2005 දින සාමාජිකයින් සඳහා ඇස්පරීක්ෂා කිරීම මෙත් සවිය කාර්යාලය ඇති ශ්‍රී විජයාරාමයේදදී පෙ. ව. 9.30 සිට ප. ව. 2.00 දක්වා සිදුකරනු ඇත. එහෙයින් ඇස් පරීක්ෂාකිරීම සඳහා සිල් නොගන්නා පවුල් සාමාජිකයින් මෙදිනට තපෝවනයට රැගෙන ඒම අත්‍යාවශ්‍ය නොවේ. නොමිළයේ කණ්නාඩි ලබාදීම පරීක්ෂාකර කණ්නාඩි තැනුවාට පසු පෙබරවාරි, මාර්තු වැනි මාසවලදී බෙදා දෙනු ලැබේ. මේ පිළිබඳ නැවත ලිපි මගින් දැනුම් නොදෙන අතර අවශ්‍යඅය එදිනට පැමිණෙන්න.

## පළමු හා තෙවන කණ්ඩායම් වල සාමාජිකත්වය අළුත්කරගැනීම

හැඳුනුම්පත් මෙතෙක් වාර්ෂික සාමාජිකත්වය දීර්ඝ කර නොගත් පළමු හා දෙවන කණ්ඩායම් වල සාමාජිකයනිගේ මෙත්සවිය සාමාජිකත්වය 31.12.2004 දින වන විට නැවත දැනුම් දීමකින් තොරව අහෝසි කිරීමට විධායක කමිටුව තීරණය කර තිබේ. මේ සඳහා කාර්යාලයට පැමිණිය නොහැකි සාමාජිකයින් හට ගෙවන කාර්යාලය "වැල්ලවත්ත" යැයි සඳහන් කල මෙත්සවිය නමින් ලියූ රු: 500/- ක් වටිනා මුදල් ඇනවුමක් හෝ 'මෙත්සවිය' හෝ ඉංග්‍රිසි භාෂාවෙන් "Meth Saviya" නමට ලියන ලද රේඛනය කල චෙක්පතක්, ලිපිනය ලියූ රු: 20.00ක මුද්දර ඇලවූ ලියුම් කවරයක් හා පරණ සාමාජික ගාස්තු ද සමග ලියාපදිංචි තැපෑලෙන් ලේකම්, මෙත්සවිය ශ්‍රී විජයාරාමය, පෙඩ්රිකා පාර, කොළඹ 06, යන ලිපිනයට 31.12.2004 දිනට පෙර එවිය යුතුයි. 05.12.2004 දින තපොවනය දාන-ශීල-භාවනා වැඩසටහන, පැවැත්වෙන දිනයේදී කලපලුවාව තපෝවනයේදී ද සාමජිකත්වය අළුත්කර ගත හැකිය.

## මෙත්සවිය ප්ලාස්ටික් හැඳුනුම්පත

ඡායාරූපවලට පෙනී සිටි මෙතෙක් ප්ලාස්ටික් හැදුනුම්පත් නොගත් සාමාජිකයිනට එය තපෝවනයේදී ලබාදීමටද කටයුතු යොදා ඇත.

## මරණයට කැප වූ සතුන් නිදහස් කිරීමේ වැඩසටහන - 28.11.2004

මරණයට කැප වු ගවයින් නිදහස් කිරීම සඳහා නොවැම්බර් 28 වන දින පෙ.ව. 5.30 ට කොළඹ 7 බෞද්ධාලෝක මාවතේ පිහිටි ධර්මගවේසි බෞද්ධ අශ්‍රමයෙන් බස්රථ වලින් පිටත් වීමට කටයුතු යොදා ඇත. පෙ. ව. 5.30 ට කඩුවෙල වැලිවිට ගව- එළු- කුකළු- ගාථනාගාරය වෙත ගොස් එවේලේ මරණ සතුන් අප සාමාජිකයින් විසින් මරණයෙන් නිදහස් කිරීම් සඳහා ලබා දුන් මුදලින් නිදහස් කරනු ලැබේ. කෙලින්ම එන අය පෙ.ව. 6.00 වන විට කඩුවෙල ඉන්ධන පිරවුම් හල අසලට පැමිණෙන්න. බස් රථයෙන් යාමට පැමිණෙන අය සමලේකම් චමින්ද මහතා අමතා (077306 5 807) නම ලබා දෙන්න. නැතහොත් මෙත්සවිය කාර්යාලයට නම් ලබා දෙන්න. පැමිණෙන බව කලින් දන්වන අය සඳහා ප්‍රවාහන පහසුකම් නොමිළයේ සපයනු ලැබේ. (මෙත්සවිය විසින් දරණු ඇත)

නිදහස් කරන සතුන් අවශ්‍ය අය වෙතොත් විස්තර ලේකම් චමින්ද මහතා වෙත දන්වන්න. අවශ්‍ය අය සඳහා සතුන් ප්‍රවාහනය කර දීම සාමාජික සාගර ලුණුවිල මහතා විසින් නොමිලයේ සිදුකර දීමට භාරගෙන ඇත.

## 30.12.2004 මෙත්සවිය වෛද්‍ය කඳවුර - මාතර හිත්තැටියෙදී

මෙත්සවිය අසරණ සරණ සුව සේවා කමිටුව මගින් පවත්වනු ලබන නොමිළයේ බෙහෙත්, ඇස් කන්නාඩි, රෝග පරීක්ෂාව ආදිය ලබා දෙන වෛද්‍ය සායනයන් හා මනෝවෛද්‍ය උපදේශන සායනයන් 30.12.2004 දින, මාතර හිත්තැටිය ගුණරත්න මුදලින්ද පිරිවෙනේදී පැවැත්වේමට කටයුතු සැලසුම් කර ඇත.

මෙත් සවිය සාමාජික පාතේගම සංකිච්ච හිමිගේ 50 වන ජන්ම දිනයද අලලා මාතර ප්‍රදේශවාසීන් සඳහා නොමිළයේ පවත්වනු ලබන මෙම සායන සඳහා ප්‍රතිකාර ලබාගැනීම මෙත් සවිය සාමාජිකයින්හටද අවශ්‍ය නම් සහභාගී විය හැකිය.

මෙත් සවිය සාමාජික වෛද්‍ය වරුන්, හෙද හෙදියන්, ඖෂධවේදීන් හා අනෙකුත් සෞඛ්‍යය සේවයට අදාල සංසදයේ සාමාජිකයින්ගේ නොමසුරු ශ්‍රමය හා බෙහෙත් ද්‍රව්‍යයද මේ පුණ්‍යකටයුත්ත සඳහා අවශ්‍යව ඇති අතර ඊට ශ්‍රම දායකත්වය ලබාදීම කැමති භවතුන් කරුණාකර 10.11.04 දිනට පෙර සභාපති ආචාර්ය චන්දන ජයරත්න මහතා අමතා (0714-800800) විස්තර ලබාදෙන්නේ නම් කෘතඥවෙන බව සංවිධායක කමිටුව දන්වා සිටී. ප්‍රවාහන පහසුකම් අවශ්‍ය අය මේ පිළිබඳ වැඩි විස්තර වැඩසටහන සංවිධායක සාගර ලුණුවිල මහතා අමතා (0777-342432) ලබාගන්න.

## 01. 05. 2005 වසරේ පළමු දින ප්‍රථම දානය

අප විසින් වාර්ෂිකව පවත්වාගෙන යනු ලබන, වසර ආරම්භයේ සාංඝික දානයක් දී ආශිර්වාද මැද වසරේ කටයුතු ආරම්භ කිරීම 01.01.2005 ජනවාරි 01 වන දින කොළඹ - 02 හුණුපිටිය ගංගාරාමයේ දී සර්වරාත්‍රික පිරිත් දේශනාවට සහභාගී වු 50 කට අධික සංඝරත්නය විෂයෙහි දෙනු ලබන හීල් දානය සඳහා සාමාජිකයින් ඕනෑම අයෙකුට පැමිණ සහභාගී විය හැක. මේ දානය සඳහා දෙන කිරිබත්, ආප්ප ආදිය සුළු සුළු කොටස් වලට කඩා කැමති දායක භවතුන් වෙත බෙදා දීම කලපලුවාව තපෝවනය දාන-සීල-භාවනා වැඩසටහන පැවැත්වෙන දිනයේ දී හා, 19.12.2004 දින පැවැත්වෙන පස්වන භාවනා වැඩසටහන ආරම්භක දිනයේදී සභාපති ආචාර්ය චන්දන ජයරත්න මහතා හා සම ලේකම් තුසිත දොඹගොඩ මහතා විසින් සිදු කරනු ඇත.

## 2005 වසරේ ප්‍රථම ඉරුදින මාසික රැස්වීම හා වැඩසටහන

02.01.2005 ඉරුදින ප.ව. 2.00 සිට 4.00 දක්වා පැවැත්වෙන 2005 වසරේ ප්‍රථම වැඩසටහන පූජ්‍ය බණ්ඩාරවෙල අමිතානන්ද ස්වාමීන්ද්‍රයන් වහන්සේගේ දෙසුමකින් හා ධර්ම සාකච්ඡාවකින් සමන්විත වේ.

වැඩසටහන පැවැත්වෙනුයේ කොළඹ - බෞද්ධාලෝක මාවතේ පිහිටි ධම්ම ගවේෂී බෞද්ධ ආශ්‍රමයේදීය. මේ පිළිබඳව නැවත ලිපිවලින් දැනුම් දෙනු නොලබන බව කරුණාවෙන් සලකන්න.

## 2005 වසර සඳහා නොමිළයේ බෙදා හරිනු ලබන මෙත් සවිය කැලැන්ඩරය

2005 මෙත්සවිය කැලැන්ඩරය 05.12.2004 දින තපෝවනයේ දී 30.12.2005, මාතර වෛද්‍ය සායනයේදී හෝ 02.01.2005 වන කොළඹ බෞද්ධාලෝක මාවතේ ධර්මගවේසි බෞද්ධ ආශ්‍රමයේදී ඇති මාසික රැස්වීමේදී 2005 වසර සඳහා සාමාජිකත්වය අළුත් කර ගත් සාමාජිකයින් හට සාමාජික කාඩ්පත ඉදිරිපත් කර ලබාගත හැකිය. නැතිනම් මෙත්සවිය කාර්යාලයෙන් ලබා ගන්න.

## සියළු සන්තාපයන්ගෙන් මිදීමට ඉන්ද්‍රිය සංවරය පූර්ව වේ

විවිධ අව්‍යාජ ප්‍රසංවයන්ගෙන් යුත් අවට ලෝකය තුළ අනුභූතිකත්වයෙන් බහිෂ්කරණය වී සම්බන්ධතා පවත්වන ෂඩ් ඉන්ද්‍රියන් බෞද්ධ ඥාන විභාගයෙන් මූලික බෙදීම් වලින් එක් අංගයක් ලෙස බුදු දහමේ සඳහන් කොට ඇත. එනම් චක්ඛු (ඇස), සෝත (කණ), ඝාන (නාසය), ජිව්හා (දිව), කාය (කය), මන (මනස), යනු ෂඩ් ඉන්ද්‍රියන් වේ. බුදුන් වහන්සේ දේශනා කොට වදාළ පරිදි විවිධ සූත්‍ර දේශනා වලට අනුව ඉදුරන්ගේ හා අරමුණුවල ගැටීමෙන් ඉන්ද්‍රිය අවධිකම උත්පාදනය වන අකාරය පිළිබඳව විස්තර කරයි. සියළුම පුද්ගලයන්ගේ අභ්‍යන්තරික ක්‍රියාකාරීත්වය සිදුවන්නේ මෙම ෂඩ් ඉන්ද්‍රියන් පූර්ව කොට ගෙනය.

ඉදුරන්ගේ ස්වභාවය වනුයේ ප්‍රියජනක අරමුණු කෙරෙහි කාමච්ජන්දයෙන් යුතුව ආස්වාදය ලැබීමත්, අප්‍රියජනක අරමුණු කෙරෙහි ව්‍යාපාදයෙන් යුතුව ගැටුම් ඇතිකර ගැනීමත්ය. ඉන්ද්‍රිය සංවරය අපහසුය. නමුත් ඉන්ද්‍රිය අසංවරය පහසුය. ඇස ප්‍රියජනක දේ නැරඹීමට කැමතිය. කන මිහිරි ශබ්ද ඇසීමට කැමතිය. නැහැය සුවඳ ආඝ්‍රාහණයට කැමතිය. දිව මිහිරි රසයන් ආස්වාදයට කැමතිය. කය සැපවත් ස්පර්ශ විඳීමට කැමතිය. මෙලෙස ඉන්ද්‍රියන් මනාප අරමුණු කෙරෙහි දක්වන අව්ධිමත් ඇලීම නිසා සමාජය තුළ බොහෝ පිරිස් විපතට ගොදුරු වන ප්‍රතිශතය සාපේක්ෂව ඉහළ මට්ටමක පවතී. බුදු රජාණන් වහන්සේ ඉන්ද්‍රිය සංවරය පිළිබඳව යථාර්තතථාර්තවත් ක්‍රමයක් මජ්ඣිම නිකායේ ඉන්ද්‍රිය භාවනා සූත්‍රයේ දී පැහැදිලි කර දුන්හ. මනාප, අමනාප ආදී ස්වභාවයෙන් යුත් අරමුණු වල යථාත්ත්වය දැන අන්තගාමී නොවී මධ්‍යම ප්‍රතිපදාවෙන් යුතුව ක්‍රියා කිරීමෙන් ඉන්ද්‍රිය සංවරය කර ගත හැකි ආකාරය එහි ඉගැන්වේ. පුද්ගලයින් ප්‍රියජනක හා අප්‍රියජනක අරමුණු කෙරෙහි අන්ධානුග්‍රාහිත්වයෙන් යුතුව කටයුතු කිරීමෙන් එකී ඉන්ද්‍රියන්ට විෂය වී ඇති ත්‍රිලක්ෂණ දේශනාවෙන් විනිර්මුක්තව විපරීත හැඟීම් වලින් යුතුව අනවබෝධයෙන් කටයුතු කරයි. ඉන්ද්‍රිය අසංවරයෙන් යුතු පුද්ගලයාට පන්සිල් රැක ගැනීමට බාදා පමුණුවන ලෙස මෙවැනි පරිහාණි දොරටු විවට වී තිබේ. එබැවින් ශික්ෂා පද මාර්ගයෙන් රක්නා සිලයට සමාන්තරව ඉන්ද්‍රිය සංවරය ඇතිකර ගැනීමටත්, සියළු සන්තාපයන්ගෙන් මිදීමට ඉන්ද්‍රිය සංවරය පූර්ව වේ යනුවෙන් බුදු පියාණන් වහන්සේ දේශනා කොට වදාල සේක.

**"ඉන්ද්‍රියානි මනුස්සානං - හිතාය අහිතාය ච**
**අරක්ඛිතානි අහිතාය - රක්ඛිතානි හිතාය'ච"**

*මෙත් සවිය සාමාජිකා*
*ඉසුරි ඉන්දිකා හෙට්ටිආරච්චි විසිනි.*
*(සාමාජික අංකය 262)*

# පන්සිල් සුරකින සමාජයක් ගොඩනගමු



1. සියළුම පාපයෙන් හැමවිට වළකින්න
සියළුම කුසල් තමවෙත රැස්කරගන්න
සියළුම අතින් සිත පිරිසිදු කරගන්න
සියළුම බුදුන් මෙය දෙසුබව සලකන්න

2. පිංවත පවින් හැමවිට වැලකී ඉන්න
නන් අකුසලින් නිතරම සිත රැකගන්න
පිංකම් කිරීමට ඔබ ඉක්මන් වන්න
අන්තිම හුස්ම හෙලුමෙදි සතුටින් ඉන්න

3. එපා පිංවතුනි පව්කම් කරන්නට
අපායෙහි තැවෙන්නට සිදුවෙයි එම ට
විපාකයට පෙර තුටුවිය හැකි යසට
සැප ගෙනදෙවන පිංකරනුය සැමවිට

*මෙත් සවිය සාමාජික ඩී.ඩබ්.ඩී. සමරදිවාකර විසිනි. (සාමාජික අංකය 109)*

බණ මඩුවෙන්

# වරද දැක අවවාද දීම නිසිකළ කළ යුතුය



## රාධ ජාතකය

**බු**දුරජාණන් වහන්සේ ජේතවනාරාමයේ වැඩ සිටි සමයේ එක් භික්ෂුන් වහන්සේ නමක් ස්ත්‍රියක් කෙරෙහි ලෝභයෙන් ඈ හා අනුරාගයෙන් බැඳී සිටියේය. ඒ බව අනෙක් භික්ෂුන් වහන්සේලා බුදු රජාණන් වහන්සේට දැක් වූ කල්හි උන්වහන්සේ ඒ භික්ෂුවට "මහණ! ලෝකයේ එදාත් අදත් අනාගතයේත් වැඩිම දෙනෙක් ස්ත්‍රීහු නිර්ලජ්ජිතයහ. මෝහාන්ධකාරයෙන් පිරුණේ අතිශයින් කුහකයහ. චපල වූ ඔව්හු වෛර බැඳගත් කල්හි නයි පොළොන් ආදී විසකුරු සපුන්ටත් වඩා විෂ සහිතයහ. කෝප වූ කල ඒ ස්ත්‍රීහු කොටි ව්‍යාඝ්‍ර ආදී වූ සිව්පා සතුන් පවා පරයන තරම් දරුණු වන්නාහ. ඔවුන්ගේ වැරදි පෙන්වා දෙන කවුරුන් කෙරෙහි වුවද පළි ගැනීමේ සිතින් වෛර බැඳ ගනිති. කවුරුන් කොහොම කීවත් ස්ත්‍රීහු ඔවුන් යන මග වෙනස් නොකරති. ගිහි ගෙය ගිනිගෙයක් වන්නේ මෙබඳු ස්ත්‍රීන් නිසාය. නිතරම ඔවුන්ගේ දිවග බොරුව හා පරුෂ වචනම ලෙල දේ සත්‍යය අවබෝධ කරවීම අතිශයින් දුෂ්කරය. කොටුපවුරු තුළ ලා සිටියත් ස්ත්‍රීහු නොපනත්කම්වල නොයෙදී නොසිටිති"

"බොහෝ අතීතයේ එක් භවයක මගේ උපස්ථායක ආනන්ද ස්ථවීරයන් දරුණු ඝාතනයකට ගොදුරු වූ ආකාරය තොප දන්නාහු නම් ස්ත්‍රීන් කෙරේ අනුරාගී සිත් ඇතිකර ගන්නවා වෙනුවට හලාහල විෂ සෙයින් සලකා දුරින් දුරු කරණු ඇත."

"ස්වාමීනි, බුදුරජාණන් වහන්ස ඒ අතීත කථාපුවත අපට විස්තර කර දෙනුමැනව"යි භික්ෂූන් ආරාධනා කළ කල්හි බුදුරජාණන් වහන්සේ "රාධ" ජාතකය දේශනා කළ සේක.

"මහණෙනි! බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙනෙක් රාජ්‍යය කරන සමයේ බුදු බව ලබා සිටින මා ගිරා කුලයක උපත ලදිමි. මට සහෝදරයකුද සිටියේය. මාත් මගේ සහෝදරයාත් දෙදෙනාව එක් වැද්දකු විසින් අල්ලාගෙන ගොස් එක් බ්‍රාහ්මණයෙකුට දුන්නේය. ඒ බ්‍රහ්මණයා අප දෙදෙනා කෙරෙහි මහත් වූ ආදරයෙන් පුත්‍රස්ථානයේ ලා හදාවඩා ගත්තේය. බෝසත් ගිරවා 'රාධ' යන නමින්ද අනෙක් ගිරවා 'පොට්ඨපාද' යන නමින්ද බ්‍රාහ්මණයා විසින් හඳුන්වනු ලැබීය.

ඔහුගේ භාර්යාව මා මතු කියන ලද ආකාර දුෂ්ට, පරුෂ, ලාමක ගති ඇති අන්‍ය පුරුෂයින් හා රති සැප විඳින ද්වේෂයෙන් හා මෝහයෙන් අන්ධ වූ ස්ත්‍රියක වූවාය. බමුණා නිවසින් පිටව ගිය පසු මේ බැමිණිය අන්‍ය පුරුෂයින් ගෙට ගෙන්වා ගෙන කරන නොපණත් කම් ඔහුද දැන සිටියේය.

ඒ නිසාම ගිරවුන් දෙදෙනා වැඩුණු පසු බ්‍රාහ්මණයා නිවසින් පිටත යන විට ඔවුන්ට කථාකොට "පුත රාධ! පොට්ඨපාද! තොපගේ මව් බැමිණිය වරදක් කරන්නේ නම් වරදෙන් වළකා ගනුව, කරදරයකට දුකකට පත්වේ නම් පිහිට වෙව"යි කියා යන්නේය.

එක් දිනක් මේ බමුණා කටයුත්තක් සඳහා කීප දිනකට ගෙයින් බැහැරව ගියේ පෙර සේම ගිරවුන් දෙදෙනාට බැමිණිය වැරදි කරතොත් ඈ එයින් වළකාලන්නට යයි කියාය.

බමුණා ගෙන් පිටව ගිය තැන් පටන් බැමිණිය ගණන් නැති වෙනත් පුරුෂයින් ගෙට ගෙන්නා ගත්තාය. බැමිණිය කරන මේ නොපණත් කම රාධ සහ පොට්ඨපාද දෙදෙනාම දකිති. දනිති. බ්‍රාහ්මණයා ගෙන් පිටට යද්දී ඔහු තමන් දෙදෙනාට කියා ගිය මෙහෙවර සිහි කොට ගත් පොට්ඨපාද, රාධ නම් තම සහෝදරයාට" අයියණ්ඩි අපි පියාණන් ගෙන් බැහැරවුයේ මෑණියන්ගේ වැරැද්දක් ඇත්නම් එය වළකාලන්නට කියා නොවේද? ඒ නිසා මේ තරම් වැරදි කරද්දී අවවාදයක් නොදී කොහොමද? යි ඇසීය.

**"පොට්ඨපාද ඒ ගැන තොපට ඇති වුවමනාව මොකක්ද? නිහඬ වව. ලාමක වූ, දුර්ජන ස්ත්‍රීයකට සුදුසු කල් පැමිණි විට අවවාද කළ හැකිය. වරදින් මුදවාගත හැකිය. නොඑසේ වූ කල්හි මහත් වූ විපතකටම පත්වන්නේ වැරදි පෙන්වා දෙන අයමය. නුවණැත්තෝ එවැනි අනුවණකම් නොකරති. එබැවින් නිහ'ඬවව'යි පොට්ඨපාදට කීවේය.**

රාධ කිව්දේ නාසා, පොට්ඨපාද බැමිණිය වෙත ගොස් ඇයට අවවාද කොට වරදෙන් මුදාගන්නට "මෑණියනි! ඔබ නොකටයුතු මේ නොහොබිනා දේ කරන්නේ කෙසේද? පියාණන් වහන්සේ ගෙන් බැහැරව සිටින කල්හි මෙවැනි ආශෝභණ වැඩ මින්මතු නොකරණු මැනව"යි කීයේය.

"හොඳයි පුතා පොට්ඨපාද තොප කියන්නක් මම පිළිපදිමි. තොප කී ආකාරයටම මම හැසිරෙමි" යි නිවුනු නිහතමානී ආකාරයක් පෙන්වමින් ඉතා තුටුපහටු සිත් ඇත්තියක සේ හඟවා පොට්ඨපාද ගිරවානන් වෙත ගොස් අල්ලා බොටුව කරකවා මරා ගින්නේලා පුළුස්සා ගෙන කෑවාය.

ගෙන් බැහැරව ගොස් සිටි බ්‍රාහ්මණයා ටික දවසකින් පෙරළා නිවසට පැමිණියේය. මඳක් විඩා නිවාගත් පසු බමුණා ගිරවාට කථා කොට "පුත රාධ! තොපගේ මෑණියන් කිසියම් වැරැද්දක් කළා ද"යි විමසීය.

**පියාණනි, නුවණ ඇති පුද්ගලයෝ යමෙකුගේ වැරදි දක්නා ලද නමුත්, ඒ වැරදි පෙන්වා දී අවවාද දීමට සුදුසු අවස්ථාවක් නොලත් කල්හි නොකියති. අනුචිත අවස්ථාවේ ඒ වැරදි පෙන්වා දී අවවාද කරන්නට ගිය පොට්ඨපාදට සිදු වූ විපත මටත් සිදුවන්න්ට තිබුණි. ඒ නිසා අනුචිත ඒ වේලාවේ මෑණියන්ට මම කිසිවක් නොකිවෙමි. මා දැන් මේ විස්තර පියාණන් වහන්සේට කීමෙන් මෑණියන් වහන්සේ මා කෙරෙහි උරණව කෝපයෙන් සිටින හෙයින් මින් පසු මා මෙහි සිටීම බොහෝ අන්තරාය කාරීය. ඒ නිසා පියාණනි, මා උපන් වනාන්තරයටම යන්නට මට අවසර දුනමැනව"යි.. කියා අවසර ගෙන'රාධ' නම් ගිරවා වනාන්තරයෙට ගියේ.**

මහණ! ස්ත්‍රීන්ගේ ගති එබඳුය. එබඳු ස්ත්‍රීන් කෙරෙහි ලෝල්ව විමුක්ති සැපත සොයා පැවිදිව සිටින මහණහු නැවතත් දුගතියට පත් නොවිය යුතුය. එදා 'රාධ' නම් ගිරවාණන්ව සිටියේ මම වෙමි. නුසුදුසු අවස්ථාවේ බැමිණියට ඇගේ වැරදි පෙන්වා දී අවවාද කියන්නට ගිය පොට්ඨපාද ගිරවාණන්ව සිටියේ ආනන්ද ස්ථවිරයෝය"යි බුදුරජාණන් වහන්සේ දේශනාව නිම කළ සේක.

**බුදුසරණ පත්‍රයෙහි පලවූ**
**ඒ. ඒ කරුණාරත්න මහතාගේ ලිපියක් ඇසුරෙනි.**

සීලංකිරේච කල්‍යාණං - සීලංලෝකේ අනුත්තරං
(ලෝකයේ සීලයම යහපත් වෙති. උත්තරීතර වෙති)

# පංච සීලය හා ආනිසංස

| | | |
|---|---|---|
| 1. පාණාතිපාතා වේරමණී | - පරපණ නැසුමෙන් වැළකීම | - ආනිසංස 23 විශේෂයෙන් දැක්වේ |
| 2. අදින්නාදානා වේරමණී | - සොර සිතින් ගැනුමෙන් වැළකීම | - ආනිසංස 11 විශේෂයෙන් දැක්වේ |
| 3. කාමේ සු මිච්ඡාචාරා වේරමණී | - වැරදි කම්සුවෙන් වැළකීම | - ආනිසංස 19 විශේෂයෙන් දැක්වේ |
| 4. මුසාවාදා වේරමණී | - මුසා බස් බිනුමෙන් වැළකීම | - ආනිසංස 14 විශේෂයෙන් දැක්වේ |
| 5. සුරාමේරය මජ්ජපමාදට්ඨානා වේරමණී | - සුරාපානයෙන් වැළකීම | - ආනිසංස 30 විශේෂයෙන් දැක්වේ |

මෙසේ මූලික වශයෙන් පංචසීලයෙන් ආනිසංස 97 ක් සඳහන් වන අතර මෙම ආනිසංසයන්ට අමතරව තවත් බොහෝ ආනිසංස ඇති බව අටුවාචාරීන් වහන්සේලා දක්වා ඇත. එක් එක් සිල් පදය රැකීමේදී ලැබෙන ආනිසංස පහත විග්‍රහ වශයෙන් දැක්වේ.

## සත්ව ඝාතනයෙන් වැළකී සිටීමෙන් ආනිසංස 23 ක් ලැබේ

| | | |
|---|---|---|
| 1. ආරෝහ පරිනාහ සම්පත්තිතා | - | ආරෝහ පරිනාහ සම්පත්තියෙන් යුක්ත වීම. |
| 2. ජව සම්පත්තිතා | - | ජව සම්පත්තියෙන් යුක්ත වීම. |
| 3. සුප්පතිට්ඨිත පාදතා | - | මනාව පොළොවෙහි පිහිටින පියවර ඇත්තෙකු වීම. |
| 4. චාරුතා | - | රන්වන් පාට සිරුරක් ඇත්තෙකු වීම. |
| 5. මුදුතා | - | මෘදු මොලොක් සිරුරක් ඇත්තෙකු වීම. |
| 6. සුචිතා | - | නිර්මල බව පිරිසිදු පැවතුම් ඇත්තෙකු වීම. |
| 7. සුරතා | - | සුර වීර ගති ඇත්තෙකු වීම. |
| 8. මහබ්බලතා | - | මහා බලවන්තයකු වීම. |
| 9. විස්සට්ඨ වචනතා | - | නොපැකිල කිව හැකි වචන ඇත්තෙකු වීම. |
| 10. ලෝක පියතා | - | ලෝක සත්වයාට ප්‍රිය මනාප පුද්ගලයකු වීම. |
| 11. නෙලතා | - | පහ කළ දොස් ඇත්තෙකු වීම. |
| 12. අභෙජ්ජ පරිසතා | - | කෙනෙකුට කේලාම් කියා බිඳවිය නොහැකි පරිවාර සම්පත්තියක් ලැබීම. |
| 13. අච්ඡම්භිතා | - | තැති නොගත් කෙනෙකු වීම. |
| 14. අප්පධංසිතා | - | විනාශ නොකළ හැකි උතුමෙකු වීම. |
| 15. පරූපක්කමේන අමරණතා | - | පර උපක්‍රම වලින් අකල් මරණයට පත් නොවන බව. |
| 16. අනන්ත පරිවාරතා | - | අනන්ත වූ පරිවාර සම්පත් ඇති බව. |
| 17. සුරූපතා | - | සුරූපී පුද්ගලයෙකු වීම. |
| 18. සුසන්ඨානතා | - | මනා සටහන් ඇත්තෙකු වීම. |
| 19. අප්පාබාධතා | - | අල්ප.ආබාධ ඇත්තෙකු වීම. |
| 20. අසෝකිතා | - | ශෝක නොකරන්නෙකු වීම. |
| 21. පියෙහි මනාපේහි සද්ධිං අවිප්පයෝගතා | - | ප්‍රිය මනාප පුද්ගයින්ගෙන් වෙන්වන්නට සිදු නොවන්නෙකු වීම. |
| 22. දීඝායුකතා | - | දීර්ඝායුෂ ලබන්නෙකු වීම. |
| 23. අඞ්ගපච්චඞ්ග සම්පන්නතා | - | මනාව පිහිටි අඟපසඟ ඇත්තකු වීම. |

## සොරෙන් ගැනීමෙන් වැළකී සිටීමෙන් ආනිසංස 11 ක් ලැබේ.

| | | |
|---|---|---|
| 1. මහද්ධනතා | - | මහා ධනවතෙකු වීම. |
| 2. පහුත ධන ධඤ්ඤතා | - | බොහෝ ධන ධාන්‍ය ලබන්නෙකු වීම. |
| 3. අනන්ත භෝගතා | - | අනන්ත භෝග සම්පත් ඇත්තකු වීම. |
| 4. අනුප්පන්න භෝග උපපත්තිතා | - | නූපන් වස්තුව උපදවීමට පුණ්‍ය ශක්තිය ඇත්තකු වීම. |
| 5. උප්පන්න භෝග ථාවරතා | - | ඇත්තා වූ භෝග රැක ගැනීමේ වාසනාව. |
| 6. ඉච්ඡිතානං භෝගානං ඛිප්ප පටිලාභිතා | - | කැමති යම් යස්තුවක් වේ ද එය වහා ගන්නකු වීම. |
| 7. රාජචොරුදකග්ගි අප්පිය දායාදේහි අසාධාරණ භෝගතා | - | රාජ, සොර, ගිනි, ජල හා අප්‍රිය දරුවන්ට සාධාරණ නොවූ විනාශ කළ නොහැකි වස්තුව ඇති වීම. |
| 8. අසාධාරණ ධන පටිලාභිතා | - | අසාධාරණ ධන වාසනා ඇත්තකු වීම. |
| 9. ලෝකුත්තමතා | - | ලෝකයේ උත්තමයෙකු බවට පත්වීම. |
| 10. නත්ථික භාවස්ස අජානනතා | - | නැත යන වචනය අහන්නෙකුවත් නොවීම. |

## බ්‍රහ්ම චරියාව රැකීමෙන් ආනිසංස 19 ක් ලැබේ

1. විගත පච්චත්ථිකතා - සතුරන් නැත්තෙකු වීම.
2. සබ්බ ජන පියතා - සියළු ජනතාවම ප්‍රිය කරන්නෙකු වීම.
3. අන්න පාන වත්ථ සයනාදිනං ලාභිතා - ආහාර පාන, ඇඳුම් පැළඳුම්, ඉඳුම් හිටුම්, කිසිදු අඩුපාඩුවක් නැතිව ලැබීමේ භාග්‍ය ඇත්තෙකු වීම.
4. සුඛ සයනතා - සැපසේ නින්ද යාම.
5. සුඛ පටි බුජ්ඣනතා - සැපසේ පිබිදීම.
6. අපාය භය විනිම්මුත්තතා - අපාය බිය නැතතෙකු වීම.
7. ඉත්ථි භාව පටිලාභස්සවා නපුංසභාව පටිලාභස්සවා අභබ්තා - කාන්තාවක් වී හෝ පණ්ඩුක නපුංසක උභතෝ බ්‍යාඤ්ජනක ආදි අභව්‍ය තත්ත්වයන්ට කිසි කලෙකත් පත් නොවීම.
8. අක්කෝධනතා - ඒ ඒ දෙය පරීක්‍ෂාකරන්නෙකු වීම.
9. පච්චක්ඛ සාරිතා - ක්‍රෝධය අඩු පුද්ගලයෙක් වීම.
10. අපත්තක්ඛන්ධතා - කර නොබාගත්තෙකු වීම.
11. අනධෝමුඛතා - (සැක බිය නිසා) බිම බලාගෙන නොසිටින්නෙකු වීම.
12. ඉත්ථිපුරිසානං අඤ්ඤමඤ්ඤ පියතා - ඔවුනොවුන්ට ප්‍රිය මනාප අඹුසැමියන් ලැබීම.
13. පරිපුණ්ණ ඉන්ද්‍රියතා - පිරිපුන් ඉඳුරන් ඇති බව.
14. පරිපුණ්ණ ලක්ඛණතා - පිරිපුන් ලක්‍ෂණ ඇති බව.
15. නිරාසංකතා - සැක නැති පුද්ගලයෙකු වීම.
16. අප්පොස්සුක්කතා - මහන්සි නොවී ධනය ලැබීමේ භාග්‍ය.
17. සුඛ විහාරතා - සැප විහරණ ඇත්තකු වීම.
18. අකුතෝ භය තා - කුමක් නිසාවත් කිසි තැනෙක බිය නොවන්නෙකු වීම.
19. පියවිප්පයෝගාභාවතා - ප්‍රියයන්ගෙන් වෙන් නොවන්නෙකු වීම.

## මුසාබස් නොබැනීමෙන් ආනිසංස 14 ක් ලැබේ.

1. විප්පසන්න ඉන්ද්‍රියතා - අතිශයින් ප්‍රසන්න ඉඳුරන් ඇත්තෙකු වීම.
2. විස්සට්ඨ මධුර භාණිතා - මනා මිහිරි කටහඬක් ඇත්තෙකු වීම.
3. සමසිත සුද්ධ දන්තතා - සමානව පිහිටි සුදෝසුදුවන් දත්ත පෙළක් ඇත්තෙකු වීම.
4. නාති ථූලතා - අශෝභන වූ මහත් ශරීර නොලබන්නෙකු වීම.
5. නාති කිසතා - ශෝභන වූ කෙට්ටු ශරීර නොලබන්නෙකු වීම.
6. නාති රස්සතා - අශෝභන වූ මිටි ශරීර නොලබන්නෙකු වීම.
7. නාති දීඝතා - අශෝභන වූ උස ශරීර නොලබන්නෙකු වීම.
8. සුඛ සම්ඵස්සතා - සැප ස්පර්ශ ඇත්තෙකු වීම.
9. උප්පල ගන්ධ මුඛතා - දුගඳක් නැති මහනෙල් මල් සුවඳ ඇති මුඛයක් ලැබීම.
10. සුස්සුසක පරිජනතා - සුවච කීකරු පරිවාර ජනයා ඇති බව
11. ආදෙය්‍ය වචනතා - විශ්වාස කළයුතු වචන ඇත්තෙකු වීම.
12. කමලුප්පල සදිසි මුදුලෝහිතතනු ජිව්හතා - නෙළුම් මහනෙල් පෙත්තක් මෙන් මෘදු වූ රත්පැහැ දිවක් ලබන්නෙකු වීම.
13. අනුද්ධතතා - උඩඟු නොවන බව.
14. අචපලතා - චපල (අදහස්,වැඩ, ක්‍රියා) නැත්තෙකු වීම.

## මත් පානයෙන් වැලකී සිටීමෙන් ආනිසංස 30 ක් ලැබේ.

1. අතිත අනාගත පච්චුප්පන්නේසු කිච්චකරණියේසු ඛිප්පං පටිජානනතා - තුන් කල්හි කරන යම් කටයුත්තක් වේද එය වහා වැටහෙන බව
2. සදා උපට්ඨිත සතිතා - සැම කල්හිම එළඹ සිටි සිහි ඇත්තෙකු වීම.
3. අනුම්මත්තකතා - උම්මත්තක නොවී ඉපදීම.
4. ඤාණවන්තතා - ඤාණවන්තයකු වීම.
5. අනලසතා - අලස නොවීම.
6. අජළතා - (ජඩ නොවීම) නොහික්මුණු, ක්‍රියා නොකිරීම.
7. අනේල මුගතා - කෙළතොලු නොවීම.
8. අමත්තතා - තරුණමදයෙන් ආදි මත් වූ ස්වභාවයක් නැති බව.
9. අප්පමත්තතා - අප්‍රමාද විහරණ ඇත්තෙකු වීම.
10. අසම්මොහතා - මොහයෙන් මුලා වී කටයුතු කරන්නෙකු නොවීම.
11. අච්ඡම්භිතා - තැති ගැනීම් නැත්තෙකු වීම.
12. අසාරම්භිතා - එකට එක නොකිරීම.
13. අනිස්සුකිතා - ඊර්ෂ්‍යා නොකරන බව.
14. සච්ච වාදිතා - සත්‍ය වචන කථාකරන්නෙකු වීම.
15. අපිසුන අපරරුස අසම්ඵප්ලලාපවාදිතා - කේලාම් රළුපරුෂ හිස් වචන කථාකරන්නෙකු නොවීම.
16. රත්තින්දිං වමතන්දිතතා - දිවා රෑ දෙකෙහි අලස බවින් තොරව කටයුතු කරන්නෙකු වීම. 17.
17. කතඤ්ඤුතා - කළ ගුණ දත්තෙකු වීම.
18. කතවේදිතා - කළ උපකාරයට ප්‍රති උපකාර කරන්නෙකු වීම.
19. අමච්ඡරිතා - මසුරු මල ධර්ම නැත්තෙකු වීම.
20. චාගවන්තතා - ත්‍යාග වන්තයකු වීම.
21. සීලවන්තතා - මහා සිල්වතෙකු වීම.
22. උජුතා - ඍජු ගත් පැවතුම් ඇත්තෙකු වීම.

9 පිටුවට

# "සුබෝ බුද්ධානං උප්පදෝ"

## (බුදු කෙනෙකු ඉපදීම සැපයට හේතුවේ)

| | බුදුන් වහන්සේගේ නම | බුදු වීමට උපකාර කොට ගත් බෝධීන් වහන්සේගේ නම |
|---|---|---|
| 1. | තණ්හංකර | රුක් අත්තන (සත්තප) |
| 2. | මේධංකර | කෑල (කිංසුත) |
| 3. | සරණංකර | පුලිල (පිප්ඵල) |
| 4. | දීපංකර | නා (නාග) |
| 6. | මංගල | නා (නාග) |
| 7. | සුමන | කුඹුක් (අජ්ජන/කකුඹ) |
| 8. | රේවත | උණ (වේළු) |
| 9. | සෝභිත | සපු (චම්පක) |
| 10. | අනෝමදස්සී | මුරුත (සෝණත) |
| 11. | පදුම | මුරුත (සෝණත) |
| 12. | නාරද | මුරුත (එම) |
| 13 | පුදුමුත්තර | සල් (සාල) |
| 14. | සුමේධ | බක්මී (කදම්බ) |
| 15. | සුජාත | උණ (වේළු) |
| 16. | පියදස්සී | කුඹුක් |
| 17. | අත්ථදස්සී | සපු (චම්පක) |
| 18. | ධම්මදස්සී | රත්කරව් (බිම්බජාල) |
| 19. | සිද්ධත්ථ | කිණිහිර (කණිකාර) |
| 20. | තිස්ස | මොර (අසන) |
| 21. | ඵුස්ස | නෙල්ලි (ආමලික) |
| 22. | විපස්සි | පලොල් (පාටලී) |
| 23. | සිඛී | ඇටඹ (පුණ්ඩරීක) |
| 24. | වෙස්සභූ | මාර (සිරිස) |
| 25. | වෙස්සභූ | සල් (සාල) |
| 26. | කෝණාගමන | දිවුල් (උදුම්බර) |
| 27. | කස්සප | නුග (නිගොධ) |
| 28. | ගෝතම | ඇසතු බෝ (අත්වැන්න) |

## "නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස"

### ඒ භගවත් අරහත් සම්‍යක් සම්බුදුරජාණන් වහන්සේට මාගේ නමස්කාරය වේවා!

**මෙම නමස්කාර පාඨය භාවිතයට ආ අන්දම.**

සිද්ධාර්ථ තාපසයාණෝ ශ්‍රී මහා බෝධිමූලයේදී ශ්‍රී සම්‍යක් සම්බුද්ධත්වයට පත් වූ අවස්ථාවේදී එහි ඉහළ අහස්තලයේ රැස්ව සිටි පිරිස අතුරෙන් සාතාගිර යක්ෂයා නමෝ (වඳිමි) යනුවෙන් ද ඇසුරේන්ද්‍රයා තස්ස (ඒ/එම) යනුවෙන් ද මහා බ්‍රහ්මයා භගවතෝ (භාග්‍යාවන්තවූ - වාසනාවන්ත වූ) යනුවෙන්ද ශක්‍ර දේවේන්ද්‍රයා අරහතෝ (අර්හත් වූ) යනුවෙන්ද කියා සම්මාසම්බුදුන් (ගෞතම) වහන්සේට වැන්දාහ"

# කර්මය

## චුල්ලපන්තක හිමිට පාඩම් කර ගන්නට නොහැකි වූ හේතුව

චුල්ලපන්තක හිමියන්ට සිව් මසක් ගතවුනත් එක් ගාථාවක් පාඩම් කරගැනීමට නොහැකි වුයේ පෙර කාශ්‍යප බුදු සසුනේ මහා නුවණැත්තෙකු වී තම ගෝලයන්ට ධර්මය කියාදෙන විට මෝඩ නූගත් භික්ෂුවක් දැක එම භික්ෂුවට කවට කම් කළ නිසා එම භික්ෂුව ලැජ්ජාවට පත්ව ධර්ම ඉගෙනීම සම්පූර්ණයෙන්ම නවතා දමන ලදී. ඒ පාපයෙන් චුල්ල පන්තක මෙම ආත්මයේ නූගත් අයෙක් විය. නමුත් ගෞතම බුදුරජුන් ගේ බුදු කරුණාවත්, චුල්ලපන්තක හිමියන් පෙර භවයන්හි පිරූ පාරමී ධර්මයනුත් මතුකරගෙන රහත් වී අසූ මහා ශ්‍රාවකයන් අතරට පත්විය.

## චක්කුපාල හිමියන්ගේ දෙනෙත් අන්ධ වීමට හේතුව

චක්කුපාල හිමියන් ගේ දෙනෙත් අන්ධ වීමට හේතුව ඒ හිමියන් පෙර ආත්ම භවයක දක්ෂ වෛද්‍ය වරයෙකුව සිටියදී බෙහෙත් ගන්නට පැමිණි අන්ධ කාන්තාවකට වෙදකම් කොට සුවපත් කරන ලදී. වෙදකම් කර ගැනීමට ප්‍රථම මාගේ අන්ධ ඇස් සුවපත් කළහොත් මම ඔබට දාසියකක් වන බව පොරොන්දු විය. සුවපත් වීමෙන් අනතුරුව දාසියක් වීමට අකමැති වූ මේ කාන්තාව වෙද මහතා හමු වී ඇස් සුවපත් නොවුන බව බොරුවට ප්‍රකාශ කලාය. මෙම කාන්තාව බොරුවක් කරන බව දැනගත් වෙද මහතා ඇස් අන්ධ වන්නටම බෙහෙතක් දමන ලදී. මේ කලා වූ මහා පාපකර්මයෙන් චක්කුපාල තෙරුවන්, රහතන් වහන්සේ නමක් වුවත් ඇස් අන්ධ අයෙකු විය.

# නිවේදන සහ නොමිළයේ පලකරනු ලබන සාමාජිකයින්ගේ දැන්වීම්

**වැදගත්**

❖ මෙත් සවිය පුවත් සඟරාවේ පළකිරීම සඳහා එවන සියලු ලිපි ද, දාන-ශිල-භාවනා වැඩසටහන් වලදී දායකත්වය දරන පිංවතුන්ද, අනෙකුත් පුණ්‍ය කටයුතු වලට අත හිත දෙන පිංවතුන්ද සඟරාවේ ප්‍රකාශනයට පත් කළ යුතු විස්තර A4 ප්‍රමාණයේ කොළවල පමණක් ලියා භාරදිය යුතුය. සාමාජිකයින්ගේ දැන්වීම් නොමිළයේ පලකරනු ලැබේ. කොළ කැබැලි හා තුන්ඩුවල ලියා එවන විස්තර අස්ථාන ගත විය හැකි බැවින් ඒ පිළිබඳ වගකියනු නොලැබේ.

❖ සාමාජික සාමාජිකාවන් විසින් එවන සෑම ලිපියකම හා ලිපිය එවන කවරයේ ද වම්පස උඩ කෙළවරෙහි තම සාමාජික අංකය පැහැදිලිව ලියා තිබිය යුතුය. ඔබගේ ලිපිනය ලියාදීම සඳහා භාවනා වැඩසටහන් වලදී අප විසින් ලබාදෙන ලිපි කවරවලද අංකය සඳහන් නොකරන හා වැරදි අංක සඳහන්කරන සාමාජිකයින් බොහෝ දෙනෙකු හමුවී ඇත. මේ අය සඳහා පුවත් සඟරාව තැපෑලෙන් නොලැබීයාම පිළිබඳව වග කියනු නොලැබේ.

*- සංස්කාරක -*

## මෙත්සවිය දුරකථන අංක

**මෙත්සවිය තොරතුරු විමර්ශනය කරනවිට පරිපාලන නිලධාරී මහතා** අමතන්න (0714-014467). එම දුරකථනයේ බිල්පත් ගෙවනු ලබන්නේ මෙත්සවිය මෛත්‍රී සංසදය විසිනි.

**මීට අමතරව සමලේකම් වරුන් වන තුසිත දොඹගොඩ (0777-710765) හා බී. ඩබ්. චමින්ද (දු.ක. 0773-065807)** යන මහතුන් ගේ පුද්ගලික දුරකථන අංකයන් අමතා ද හදිසි තොරතුරු ලබා ගත හැකිය.

**සංසදයේ සභාපති ආචාර්ය චන්දන ජයරත්න මහතා ඇමතීම පුද්ගලික දුරකථන අංක (0714 800800 හෝ 0777 309385)** මගින් දහවල් 12.00-1.00 ත් අතර හෝ රාත්‍රී 8.30-9.30 ත් අතර පමණක් (ඉතා හදිසි අවශ්‍යතාවයකදී ඕනෑම වේලාවක) සිදුකරන්න. (දිනකට දුරකථන පණිවිඩ 30 ක් පමණ ලැබෙන නිසා සාමාජික අංකය හා නම පවසා සංක්ෂිප්ත ලෙස ඔබගේ විමසීම් සිදුකරන්නේ නම් මැනවි.)

## පස්වන භාවනා වැඩසටහන

**2004 දෙසැම්බර් 19 සිට ඇරඹීමට නියමිත පස්වන භාවනා වැඩසටහන සඳහා 30.09.2004 දිනට පෙර සාමාජිකත්වය අළුත්කරගත් පළමු කණ්ඩායමේ සාමාජිකයිනට සහභාගි විය හැක. සාමාජිකත්වය අළුත් කරගන්නා විට භාවනා වැඩසටහනට පැමිණෙන/නොපැමිණෙන බව කාර්යාලයට දන්වන්න.**


**මනාව සැලසුම් කල සොඳුරු නිවසක් සඳහා**

**Home Sweet Home Design**

161, කන්දවිහාර පාර, කළුවාමෝදර, අලුත්ගම.

034-2272040

එම්. ඒ. එල්. චන්ද්‍රලතා

වාස්තු විද්‍යා තාක්ෂණඥ

(Architectural Technologist)


## ප්‍රායෝගික අධිමානසික විද්‍යාව හා පංච අභිඥා පිළිබඳව දැනුවත් කිරීමේ වැඩ සටහන

**මෙම වැඩසටහන 19.12.2004 වන දින පෙ.ව.10.30අරඹනු ලැබේ**


**ඔබේ මංගල සිහිවටනය විශේෂ අවස්ථා ජායාරූපගත කර ගැනීමට**

විමසන්න: මෙත්සවිය සාමාජික

එස්. පී. පියරත්න

නො: 2/6/බී, ගම්පහ පාර

මිරිස්වත්ත

ටෙලි: 03322 26534



**දෙමළ භාෂාව විෂය ශ්‍රේණි 2 සිට 11 දක්වා ඉගැන්වීම**

**අගනුවර ජනප්‍රිය පාසැලක ආචාරිණී වජිරා ගුණවර්ධන මහත්මිය අමතන්න.**

**දුරකථන අංකය :-2935866**


7 පිටුවෙන්.....

| | | | |
|---|---|---|---|
| 20. | වාගවන්තතා | - | ත්‍යාග වන්තයකු වීම. |
| 21. | සීලවන්තා | - | මහා සිල්වතෙකු වීම. |
| 22. | උජුතා | - | ඍජු ගත් පැවතුම් ඇත්තෙකු වීම. |
| 23. | අක්කෝධනතා | - | ක්‍රෝධ නොකරන සත්පුරුෂයෙකු වීම. |
| 24. | හිරිමනතා | - | පව් කිරීමට ලැජ්ජා ඇති ගුණවත් අයෙකු වීම. |
| 25. | ඔත්තප්පිතා | - | පව් කිරීමට බිය ඇත්තෙකු වීම. |
| 26. | උජුදිට්ඨිකතා | - | ඍජු අදහස් ඇත්තෙකු වීම. |
| 27. | මහාපසද්සදතා | - | මහා ප්‍රසාදවන්තයකු වීම. |
| 28. | මේධාවිතා | - | මහා චිත්ත ශක්තියක් ඇත්තෙක් වීම. |
| 29. | පණ්ඩිතතා | - | දාර්ශනික අදහස් ඇති පණ්ඩිතයෙකු වීම. |
| 30. | අත්ථානත්ථ කුසලතා | - | අර්ථය අනර්ථය වටහෙන හසළ බුද්ධියක් ඇති බව. |

"ධම්මෝ හවේ රක්ඛති ධම්මචාරී" - *ධර්මයෙහි හැසිරෙන්නා ධර්මයෙන්ම රකිනු ලැබේ*

"ධම්ම කාමෝ භවං හෝති - ධම්ම දෙස්සී පරාභවෝ" - *ධර්මකාමියා දිනයි, වැඩෙයි - ධර්මද්වේශියා පරදියි, පිරිහෙයි.*

## මෙත් සවිය මෛත්‍රී සංසදය සාමාජික අයදුම්පත

**(ඡායා පිටපතද භාර ගනු ලැබේ. මෙම සියලු තොරතුරු සම්පූර්ණයෙන්ම රහසිගතව තබා ගනු ලැබේ.)**

1. සම්පූර්ණ නම ........................................

2. ස්ත්‍රී / පුරුෂ භාවය ........................ 3. ජාතික හැඳුනුම්පත් අංකය. ........................ (ඡායා පිටපතක් අමුණන්න)

4. උපන් දිනය ........................ 5. වයස ................ 6. ආගම ........................

7. ස්ථිර ලිපිනය ........................................

........................ විද්‍යුත් තැපැල් (E-mail)........................ දුරකථන අංකය ........................

8. දිස්ත්‍රික්කය ........................ 9. විවාහක / අවිවාහක බව ........................

10. රැකියාවක් කරන්නේ නම් ඒ පිළිබඳ විස්තරඃ ........................................

........................................

11. කාර්යාලීය ලිපිනය හා දුරකථන අංකයඃ ........................................

12. ලිපි එවිය යුතු ලිපිනයඃ ........................................

13. ලබා ඇති ඉහළම අධ්‍යාපනික සුදුසුකම්
    1. ........................................
    2. ........................................

14. වෙනත් සංගම් ආදියෙහි තනතුරු හෝ සාමාජිකත්වය දරන්නේ නම් ඒ පිළිබඳ විස්තර
    1. ........................................
    2. ........................................
    3. ........................................

15. ඔබ කිසියම් ශාරීරික රෝගයකින් (ඇදුම, හෘද රෝග, දියවැඩියාව, රුධිර පීඩනය, අපස්මාරය) පෙලෙන්නේ නම් ඒ පිළිබඳ විස්තර ........................................

16. ඔබ කිසියම් මානසික රෝගයක් සඳහා වෛද්‍ය ප්‍රතිකාර / බෙහෙත් ලබාගෙන තිබේද? ඔව්/නැත.

17. එවැනි මානසික රෝගයකින් පෙලෙන්නේ නම් ඒ පිළිබඳ විස්තර ........................................

18. ඔබ විසින් සඳහන් කළයුතු මෙහිදී වැදගත්යැයි හැඟෙන වෙනත් විස්තර හෝ යෝජනා/අදහස් තිබේනම් මෙහි සඳහන් කරන්න. ........................................

........................................

මා දන්නා තරමින් ඉහත කරුණු සත්‍ය බවට ප්‍රකාශ කරමි. සාවද්‍ය තොරතුරු සැපයීම සමාජිකත්වය අවලංගු කිරීමට හේතුවක් ලෙස මා පිළිගනිමි.

දිනය ........................ අයදුම්කරුගේ අත්සන ........................

**කාර්යාලීය ප්‍රයෝජනය සඳහා**

සාමාජික අංකය ........................

තේරීම් කමිටුවේ තීරණය

........................
තේරීම් කමිටු සභාපති

........................
විධායක ලේකම්

දිනය ........................

සැ.යු. මෙම අයදුම් පත සමගම ඔබ වෙනුවෙන් පවත්වන විවිධ දේශන/වැඩමුළු/මනස දියුණු කිරීමේ වැඩ සටහන් සංවිධානය කිරීම, දේශන ශාලා ගාස්තු, ශ්‍රව්‍ය දෘශ්‍ය උපකරණ ගාස්තු, පුවත්පත් දැන්වීම්, මුද්‍රිත සටහන් සැපයීම, ඡායාරූපය සහිත ප්ලාස්ටික් හැඳුනුම්පත් සැපයීම, තැපැල් ගාස්තු, විදුලිය ගාස්තු, කාර්යාල ගාස්තු හා පරිපාලන නිලධාරී මහතා වෙනුවෙන් කරනු ලබන මාසික ගෙවීම් ආදිය සඳහා යන බරපැන පියවා ගැනීම සඳහා රු. 1000/=ක මුදල් සාමාජිකත්වය පිරිනැමුවාට පසුව එවිය යුතුය. (ඒ ඇතුළත්වීමේ ගැස්තුව රු. 500/= හා වාර්ෂික සාමාජික මුදල රු.500/=වශයෙනි.) මෙම බරපැන ගෙවීමට නොහැකි ඉතා අඩු ආදායමක් ලබන පවුල්වල අය තම ආදායම තහවුරුකළ හැකි ලිපි ලේඛන සහිතව ග්‍රාම නිලධාරීතුමා මගින් විධායක කමිටුව වෙත සාමාජික ගාස්තුව ඉවත්කිරීම සඳහා කරනු ලබන ඉල්ලුම් සලකා බලනු ඇත. සාමාජික ගාස්තු ගෙවීම, ඔබ තෝරාගත්තාට පසුව කාර්යාලයට පැමිණ සිදු කළ යුතුය. (දිනය පසුව දැනුම් දෙනු ලැබේ). කාර්යාලය සෙනසුරාදා, ඉරිදා ද ඇතුලුව සතියේ දින 5 ක් විවෘතව පවතී. අයදුම් කරන සෑම කෙනෙකුම තෝරා නොගන්නා අතර එසේ තෝරා නොගැනීමට හේතුව දැනගැනීමට අවශ්‍ය නම් අයදුම්පත් විමර්ශනය සඳහා වන ඇතුලත් වීමේ ගාස්තු ගෙවිය යුතු වන්නේය.

*නිසිපරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත් ජාතික හැඳුනුම්පතේ ඡායා පිටපතක් සහ ලිපිනය ඇති මුද්දර කවර දෙකක් සමග පහත සඳහන් ලිපිනයට තැපැල් මගින් යොමුකරන්න.*

*(අයදුම් පත සමග කිසිදු මුදලක් හෝ චෙක්පතක් නොඑවන ලෙස කරුණාවෙන් දැනුම්දෙනු ලැබේ.)*

*ලිපිනයඃ- ගරු ලේකම්, මෙත් සවිය, ශ්‍රී විජයාරාමය, පෙඩ්රිකා පාර, කොළඹ 06. දුරකථන 0714-014467*

## පිං පොතෙන් බිඳක්....



ශ්‍රී විජයාරාමාධිපති අතිපූජ්‍ය අහංගම ආනන්ද ස්වාමීන්ද්‍රයන් වහන්සේගේ පැවැදි ජීවිතයට වසර 64 ක් පිරීම නිමිතිකොටගෙන 10.10.2004 දින බුද්ධ ප්‍රතිමා ප්‍රධානය කරන අවස්ථාව.



ප්‍රභාත් මහත්මාට ආශිර්වාද පතා ඇස්, සහ සිරුර දන්දීමේ පත්‍රිකා හතරවන භාවනා කණ්ඩායම වෙත බෙදන අවස්ථාව.



2004 ඔක්තෝම්බර් මාසයේදී අවසන් කළ හතරවන භාවනා වැඩසටහනට සහභාගී වූ පිරිස.



මෙත්සවිය සාමාජික සාමාජිකාවන් ඇතුළු ශ්‍රී විජයාරාම විහාරස්ථානයට පැමිණෙන පිංවතුන්ගේ පරිහරණය පිණිස වැසිකිළි තුනක් තැනූ මෙත්සවිය සාමාජික සාගර ලුණුවිල සහ සරත් ඉලන්ගංතිලක මහත්මාණන් විසින් එය පන්සලට පූජාකරන අවස්ථාව.

## අපගේ ආශිර්වාද හා පුණ්‍යානුමෝදනාව...

- 05.09.2004 දින අලුත්ගම තලවත්ත ධර්මදිවිප යෝගාශ්‍රමයේ පංචකප දූපතේදී පැවැත්වූ පස්වන ත්‍රෛමාසික දාන-සීල-භාවනා වැඩ සටහන සංවිධානය කල හා ගිලන්පස පූජාකල අලුත්ගම කුමාර විමලසේන මහතා එම්. ඒ. එල්. චන්ද්‍රලතා මහත්මිය සහ ඒ සඳහා මූලික යෝජනාව කල එම දෙපලගේ දරුවන් වෙත හා ඔවුන්ගේ සියළුම මළගිය ඥාතින් වෙත.
- එදින හවස වාද්දුවේදී ගිලන්පස පූජා කල සමාජික එස්. එයි. මෙන්ඩිස් මහත්මාට, එම ඥාතින්ට හා සියළු මළගිය ඥාතින්ට.
- රු. 80000/- දහසක් වියදමින් සංසදයේ සමාජිකයන්ගේ හා පංසලට එන පිංවතුන්ගේ පරිහරණය පිණිස වැල්ලවත්ත ශ්‍රී විජයාරාමයේ වැසිකිලි තුනක් තනා (අටමහා කුසලයන්ගෙන් එකකි) පූජාකල සාගර ලුණුවිල මහතාට හා සරත් ඉලන්ගංතිලක මහතාට හා එම පවුල්වල සියළු මළගිය ඥාතීන්ට.
- ශ්‍රී විජයාරාමයේ භාවනාව සඳහා ශාලා පහසුකම් වැඩිකර ගැනීම පිණිස වෙනම කාමරයක් තනාදීමට රු. 27000/- පමණ මුදලක් පරිතයාග කල (ටයිල් සඳහාදුන් මුදල් මේ වෙනුවෙන් යෙදවේ) සියලු සමාජිකයිනට හා ඒ සඳහා රු 25000/=ක පමණ මුදලක් පරිත්‍යාග කල අධි මානසික විද්‍යා පංතියේ සාමාජික භවතුන්ට.
- මෙත් සවිය පරිහරනය සඳහා ප්‍රින්ටරයක් හා ඕජී උපකරණයක් පරිත්‍යාගකල එස්. එච්. ඉලංගන්තිලක මහත්මාට මෙත් සවිය පුස්ථකාලය වෙනුවෙන් පොත්පත්, කැසට්, සෘ ආදිය පරිත්‍යාගකල නම් සඳහන් නොකරන ලෙස ඉල්ලා සිටි සියලු සාමජික සාමාජිකාවනට හා සාමාජිකයන් සඳහා නොමිලයේ භාවනා අත් පොත් මුද්‍රණය කර බෙදා දීමට කටයුතු කල රංජිත් සොයිසා මහතා ඇතුළු පිරිස වෙත.

සැකසුම: ආචාර්ය චන්දන ජයරත්න.



05.09.2004 ඉරුදින අළුත්ගම තලවත්ත ධර්මදීප යෝග්‍රාශ්‍රමයේ මුහුද මැද පිහිටි පංචකප දූපතේදී පැවැත්වූ පස්වන දාන-සීල-භාවනා වැඩසටහනට සහභාගී වූ මෛත්සවිය සාමාජික පිරිස.

මුද්‍රණය ආර්.ජී. ග්‍රැෆික්ස්-බොරලැස්ගමුව. 5554300